# ගෙවී ගිය මව්වරුන්ගේ දිනය

නිර්වර්ණ
උපේක්ෂා සේනානායක
COLOURLESS

මව්වරුන්ගේ දිනයක් සැමරීම පිළිබඳව තර්කයක් මතුකිරීමට හෝ එහි වෙළඳපල හා බැඳුණු ආර්ථික කාරණාව අරභයා මගේ මතය තහවුරු කිරීම සඳහා මෙම ඉඩ වෙන් නොකිරීම මගේ අරමුණයි. මන්දයත් එහි වලංගු සාපේක්ෂභාවය පැහැදිලිව පෙනී යද්දී මගේ තර්ක ඉදිරිපත් කිරීම කාලය නාස්ති කිරීමක් වන බැවිනි. නමුත් අහම්බයෙන් මෙන් මෙවර මව්වරුන්ගේ දිනය සඳහා වෙන් කර තිබූ සති අන්තයට ආසන්න සිකුරාදාවේ මම මගේ කුඩා දියණියන් දෙදෙනා සමඟ අතවශ්‍ය භාණ්ඩ කිහිපයක් මිලදී ගැනීම වෙනුවෙන් මට ආසන්නම සාප්පු සංකීර්ණයට පිවිසුණෙමි. එහි ඉහළ මාලයේ එක් පටුබිම් තීරුවක කුඩා දරුවන් වෙනුවෙන් කිසියම් දෙයක් සංවිධානය වී තිබුණි. මව්වරුන්ගේ දිනය වෙනුවෙන් සුබ පැතුම් පත් සකස් කිරීමට දරුවන්ට අවශ්‍ය සියළු කලමනා සහ බංකු සූදානම් කර තිබුණි. මගේ දරුවන් දෙදෙනා එතැනට දිව ගියේ ඉපිල යන සතුටින් බැවින් ප්‍රමාදය නොතකා මම එතැන රැඳුණෙමි.

විවිධ වර්ණ වලින් යුත් ගනකම් කඩදාසි, කුඩා පින්තූර, පාට කූරු සහ ගම් එමට තිබූ බැවින් දරුවෝ සිත් සේ සිය සුබපැතුම් පත් සකස් කිරීමට යුහුසුළු වුණහ. මව්වරුන් සඳහා වෙන්කළ බංකුවේ අසුන්ගෙන මම ඔවුන් දෙස බලා සිටියෙමි. මට ආසන්නම බංකුවේ වාඩි වී සුබ පැතුම් පත සකස් කළ දරුවා දකුණු ආසියාතික පෙනුමෙන් යුක්ත වූ අතර ඇගේ මව ඇය සකස් කරන සුබපැතුම් පතේ මවට අවශ්‍ය පරිදි වෙනස්කම් කරමින් දරුවාට නිදහසේ සිය නිර්මාණය කිරීමට ඉඩ නොදෙනු මම දුටුවෙමි. මේ අතරවාරයේ මවට දුරකථන ඇමතුමක් ලැබී ඈ තරමක් මෑත් වූ අතර දරුවා නිදහසේ යමක් තනියම ලියනු මම දුටුවෙමි. දුරකථන ඇමතුම අවසන් කළ මව කඩිනමින් ඇවිත් දරුවාගේ නිර්මාණයට එබුණාය. එවර ඇය නොනවත්වා දරුවාට බැනවදින්නට වූයෙන් ඇය ලාංකික කාන්තාවක් බව මට ඒත්තු ගියේය.



"ඈ ළමයො මදර් කියලා ලියන්නෙ මෙහෙමද? දැන් ග්‍රේඩ් වන් නේද ඉන්නෙ. කොච්චර වචන ලියවනවද මං ගෙදරදි. ඒ වුණාට තනියම මදර් කියලා ලියාගන්න බැහැ" මව කෝපාවිශ්ටව බැණ වැදී දරුවාගේ අතින් අදින්නට වූවාය.

"දාස් ගනන් වියදං කරලා කුමෝනුත් යවනවා. ඒ වුණාට මෙලෝ වැඩක් නැහැ. ඉන්නවකො මං තාත්තාට කියන්න" දරුවා හඬන්නට වූ අතර මව ඇගේ අතින් ඇදගන හැල්මේ ඇවිද ගියාය.

අප වෙහෙස මහන්සි වී දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබාදිය යුතු බව සැබෑය. ඒත් ළපටි සිත් වල ඇති නිදහස් ප්‍රාර්ථනා වලට වැට කඩුලු බැඳීමට අපට කිසිදු ශිලාචාර අයිතියක් නැත.
මව්වරුනගේ දිනය වෙනුවෙන් තම මව සඳහා තමන්ට රිසි පරිදි සුබ පැතුම් පතක් සෑදීමට දරුවකුට ඇති අහිංසක අයිතිය උල්ලංගනය වීම මොනතරම් ඛේදවාචකයක්ද?

මගේ පාසල් මිතුරියක වන පහන්රසී මව්වරුන්ගේ දිනය වෙනුවෙන් මට එවූ සුබ පැතුමක මෙසේ සටහන් වී තිබුණි.

සියළුම මව්වරුන්ට,
මව්වරුන් අහිමි සියළු දරුවන්ට,
දරුවන් අහිමි වූ සියළු මව්වරුන්ට,
තම දරුවන්ට මවක් වන්නට සිදුවූ සියළු පියවරුන්ට,
මවක් මෙන් කිසියම් දරුවකුට පෙම් කළ සියල්ලන්ටම,
සුබ මව්වරුන්ගේ දිනයක්,
පතමි මම සෙනෙහසින්....

නිවුන් දරුවන් තිදෙනෙකුගේ ආදරණීය අම්මා වූ මගේ මිතුරිය මොන තරම් පුළුල් අර්ථකතනයක් මව්වරුන්ගේ දිනය වෙනුවෙන් සපයා තිබුණිද. එය කොතරම් සංවේදී සහ යථාරූපීද. ඇයත් ඇතුළුව මෙලොව සියළුම මව්වරුන්ට මගේ උත්තමාචාරය නිර්වර්ණ තුලින් පුදකරමි.

# ධර්මසිරි බණ්ඩාරනායක අවදි කළ තමිළිනී පිළිබඳ මතකය




## ශ්‍රීලාල් සෙනෙවිරත්න

මෙම පොත පළකිරීමට තීරණය කළ නිසා, පසුගිය මාසයක පමණ කාල පරිච්ඡේදයක් තුළ, කුණුබක්කිවල තියන ඒවා අරගෙන, මට දමා ගහනවා මම විවිධාකාර මාධ්‍යයයන් මාර්ගයෙන් දැක්කා. තමන්ට කරන්න බැරි වැඩේ තව කෙනෙක් කරනකොට පහරදෙන ජාතියක තමයි මම උපත ලබලා තියෙන්නෙ. ඒ ප්‍රහාර මට අලුත් දේවල් උනේ නැහැ. ''උඹව මරණවා'' කියලා මහසොහොන් බලකාය විසින් එවන ලද ලියුම් අතේ තියාගෙන තමයි අපි පසුගිය කාලේ යුද්ධයට විරුද්ධව හඬ නැගුවේ. අපි හඬනැගුවෙ දේශපාලන වේදිකාවල්වල නෙමෙයි, නාට්‍ය කලාව, සිනමා කලාව ඇතුළු අපි සිටින කලා මාධ්‍යවලින් ජනතාවට මේ ඇමතුම කරන්න මම උත්සාහ කළා. ඒ උත්සාහ කරන කොට බොහෝ අය ඇහුවෙ ''ඇයි මෙහෙ ඉඳගෙන මේක කරන්නෙ? උතුරට ගිහිල්ලා මේක කරන්නෙ නැත්තෙ ඇයි?'' කියල. අපි උතුරට ගියා. උතුරට ගිහිල්ලා අපි අපේ නාට්‍යය පෙන්නුවා. එම නාට්‍ය පෙන්නපු එක අවස්ථාවක් මගෙ මතකයට එනවා. ස්වාමිනාදන් විමල් සහෝදරයා පළමුවතාවට මම අඳුරගත්තෙ පළවෙනි වතාවට මගෙ ට්‍රෝජන් කාන්තාවො නාට්‍යය 2003 වසරෙ යුද්ධය පවතිත්දි, සාම සාකච්ඡා පවත්වන අවස්ථාවේ, ඒ හිඩැස අපි පාවිච්චි කරලා යාපනයේදී පෙන්වපු අවස්ථාවකදි.

මගේ මතකයට එනවා, අපි ට්‍රෝජන් කාන්තාවො යාපනේ පාසලක පෙන්නනකොට, ''තියුණු අසිපතක සෙවණ යට'' ලියන ලද, තමිළිනී කියන දේශපාලන අංශ නායිකාව, කැමුප්ලාජ් යුනිෆෝම් එකක් ඇඳගෙන, තුවක්කුවක් අතේ නැතිව, ඉස්සරහ පෙළේ පුටුවක වාඩි වෙලා, නාට්‍ය දිහා පැය 2 2/1 ක්. බලාගෙන හිටිය. මම ස්වාමිනාදන් විමල් සහෝදරයගෙන් ඇහුවා, ''කවුද එයා?'' කියල. එතකොට තමයි දැනගත්තෙ එල්ටීටීඊ දේශපාලන අංශ නායිකා තමළිනි කියල. මම දන්නෑ නාට්‍ය තුළින් කුමන හෝ වෙනසක් ඇය තුළ ඇතිවුනාද කියල.



ඊට පසුව මනමේ සහ ට්‍රෝජන් කාන්තාවො දෙකම අපි ප්‍රදර්ශනය කෙරුවා ත්‍රිකුණාමලේ දී. ඒක එල්.ටී.ටී.ඊ. සංවිධානෙ සංස්කෘතික උළෙලක්. එම උත්සවේ කොඩිය එසෙව්වෙ තමිළිනී කියලා යාන්තම් මගේ මතකයේ තියෙනව. අපි ඒ අවස්ථාවන් අපතෙ හැරියෙ නැහැ. අපි හැකිතාක් දුරට දෙමළ ජනතාව සමග ඔවුන්ගෙ රසික ඥානය වර්ධනය කිරීමට අවස්ථාවක් සොයමින් ඒ ප්‍රදේශවලට එල්.ටී.ටී.ඊ මුර පොළවල්වලින් ඇතුල්වෙලා, ඔවුන්ට ආමන්ත්‍රණය කරන්න උත්සාහ කළා. ඒ කිසිම උත්සාහයක් වැරදුනේ නෑ. අදටත් ජීවතුන් අතර ඉන්නවද කියල හොයන දෙමළ සහෝදරවරුන්, දෙමළ කලාකරුවන් අපේ සහෝදර කලාකරුවන්ට එකතු කරල දුන්නා. ඒක තමයි අපි ලබපු ජයග්‍රහණය.

ඔම තනි මනුස්සයෙක් ආණ්ඩුවක් නෙමෙයි. හැබැයි ආණ්ඩුවක් පෙරළන්න තනි මිනිහෙකුටත් පුලුවන්. හිතන්න එපා තනි මිනිහෙකුට එහෙම බෑ කියල. තනි මනුස්සයෙක් බවට පත් වෙලා තමයි මේක කරන්න මට සිද්ධ වුනේ. මේ පරිවර්තන කාරණායේදී මගේ ඉල්ලීම ඉටු කළ ස්වාමිනාදන් විමල් සහෝදරයාට මේ වෙනුවෙන් එක රුපියලක් ගෙවල නෑ.

අපිට එල්.ටී.ටී.ඊ. පච්චය අවුරුදු ගාණක් තිස්සෙ කොටල තියෙනව. ඒ පච්චෙ කොටපු එවුන් වෙනුවෙන් අපි අනුකම්පා කරනව. නමුත් ඒ අයට අද සිද්ධවෙලා තියනවා, තමන් හිටපු තැනින් වෙනස් වෙන්න. වෙනස් වීමට මනුස්සයෙකුට අයිතියක් තියෙනව. රසාස්වාදන ශක්තියෙන් මනුස්සයෙක් වර්ධනය වෙනකොට මනුස්සයෙක් වෙනස් වෙනව. වයසට යනකොට මනුස්සයෙක් වෙනස් වෙනව. අත්දැකීම් සහිත වෙනකොට මනුස්සයෙක් වෙනස් වෙනව. ඒ සමාජ වටිනාකම ලබා ගන්න සෑම මනුස්සයෙකුටම අයිතිය තියෙනව. ඒ හිමිකම වෙනුවෙන් අපි පෙනී හිටිය. තමිලිනීගේ මතකය මම ඔබ ඉදිරියේ තියන්නේ, අද ඇගේ පොතේ සිංහල පරිවර්තනය දොරටවැඩීමේ නිමිත්ත වෙනුවෙනුයි. 2007 වසරේ දී ලන්ඩන් නුවර ඇවිදගෙන යනකොට, මට එක්තරා දෙමළ තරුණයෙක් මුණ ගැසුනා. ඔහු ජෙයකුමාර්. ඔහු මාව නාට්‍ය ශාලාවලට එක්කගෙන ගියා. ඔහු ටිකට් ගත්තා. මගේ චිත්‍රපට කිහිපයක් ලන්ඩන් නගරයේ ප්‍රදර්ශනය කරනකොට ඔහු ඒවා නරඹලා, මාව අඳුරගෙන ඒ මිත්‍රත්වය මත ඉතාම විශ්ෂ්ට ගනයේ නාට්‍ය ගණනාවක් බලන්න මාව එක්කගෙන ගියා. ඔහු ගැන විස්තර කරනකොට ඔහුගේ පියා මරල තියෙන්නෙ එල්.ටී.ටී.ඊ. සංවිධානයෙන් 1983දි කියල මට දැනගන්නට ලැබුණා. ඔහු මේ රට අතහැරල ලන්ඩන් නගරයට ගියා. එහිදී අපි මුණගැසුණා. මිත්‍රයින් බවට පත්වුනා. පස්සෙ ඊමේල් මගින් හමුවුනා. 2013 වසරෙදි ඔහු විවාහ වුනා කියල මට ආරංචි වුනා.

2015 වසරෙ එක්තරා දවසක ඔහු මට කතා කළා දෙහිවල ඉඳල. ඔහු කිව්ව ''මගෙ නෝනට සනීප නැහැ'' කියල. ඔහු කිව්වා ''පුලුවන් නම් මට හොඳ වෛද්‍යවරයෙක් හොයා දෙන්න'' කියල. මම කිව්වා ''ඔය තියන පරීක්ෂණ වාර්තා අරගෙන යමු වෛද්‍යවරයෙක් හමුවෙන්න'' කියල. ඇයට ඇත්තේ පිළිකාවක් කියල අනුමාන කරල, මහරගම පිළිකා රෝහලේ විශේෂඥ වෛද්‍ය මහේන්ද්‍ර පෙරේරා මහතා ළගට මම ඔහුව එක්කරගෙන ගියා. එතුමා වහාම රෝගියා රෝහල් ගත කිරීමට තීරණය කළා.
ජයකුමාර්ගෙ පියා මරල තියෙන්නෙ එල්.ටී.ටී.ඊ. සංවිධානයෙන්. ඔහු බැඳල හිටියෙ තමළිනි කියලා මම දැනගෙන හිටියෙ නැහැ. මට ඔහු කීවා මගෙ බිරිඳ තමයි තමළිනී කියල. මම ඈ ගැන වාර්තා චිත්‍රපටයක් කරන්න අදහස් කළත් පුනරුත්ථාපන නීතිරීති අනුව එය කරන්න නොහැකි වුනා. මම ඇගෙන් ඉල්ලා සිටියා ඔබේ අත්දැකීම් ලියන්න කියල. මේ ලිවීම ඉතා වැදගත් වෙනව. ජයකුමාර් ඇය විවාහ වෙලා මාස 1 2/1 ක කාලයක් ඇතුළෙ රෝගී වෙලා පණ අදිනව මම මගෙ ඇස්දෙකෙන් දැක්කා. ඩොක්ටර් නිහාල්, ඩොක්ටර් මහේන්ද්‍ර පෙරේරා ඉතාම මහන්සියෙන් මෙම රෝගියා සුවපත් කරන්න මහන්සි වුනා. ඔවුන් ජාතිවාදීන් නෙමෙයි. තමන්ගේ රෝහලට පැමිණි රෝගියා ජීවත් කරන්න ඔවුන් දරපු උත්සාහය මට අමතක කරන්න බැහැ.

තමළිනී ජීවත් කරවන්න එතුමා සෑහෙන උත්සාහයක් දැරුවා. එක් දවසක් රාත්‍රියේ තමළිනි එතුමාගේ දෑත් අල්ලල වැඳල ''මේ වගේ මනුෂ්‍යයො සිංහල මිනිස්සු අතර ඉන්නව කියල මම දැනගෙන හිටියෙ නෑ'' කියල තියෙනව. ඒක තමයි සංහිඳියාව කියන්නෙ. ඒකට සල්ලි ඕනෙ නෑ. මනුස්නකම, කරුණාව විතරයි ඒකට ඕනෙ. අපි බෞද්ධයො. අපි බෞද්ධයො නම් ඇයි අපි ළඟ කරුණාව නැත්තෙ? මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා යන අංශ හතරෙන් අපිට මනුස්සයෙක් දිනාගන්න පුලුවන්.
මෙම පොත යුද සාහිත්‍යයක ආරම්භයක්. මෙම යුද සාහිත්‍ය ඉතාමත් වැදගත් වෙනව මනුෂ්‍යත්වය රැක ගැනීම සඳහා.

*("තියුණු අසිපතක සෙවණ යට" කෘතිය එළිදැක්වීමේ උත්සවයේදී ධර්මසිරි බණ්ඩාරනායක සිනමාවේදියා දැක්වූ අදහස්වල සංක්ෂිප්ත සටහනකි)*